සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

15.02.2024
Resource Centre
De Mazenod College
Kandana
50872

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි. |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

**සැලකිය යුතුය**

- I කොටසේ සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාරදෙන්න.

---

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) පාසල පිහිටා ඇති කුඩාම පරිපාලන ඒකකය වන්නේ මින් කුමක්ද?
   1. ග්‍රාම නිලධාරී කොට්ඨාසය　　2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
   3. දිස්ත්‍රික්කය　　4. පළාත

2) සබරගමු පළාතට අයත් දිස්ත්‍රික්කයකි.
   1. මහනුවර　　2. කුරුණෑගල
   3. රත්නපුරය　　4. මාතර

3) වර්ෂාපතනය මනිනු ලබන්නේ කුමන ඒකක වලින්ද?
   1. මිලිලීටර්　　2. මිලිමීටර්
   3. සෙන්ටිමීටර්　　4. පැයට කිලෝමීටර්

4) කාලගුණික අංග අතර මූලිකාංගය වන්නේ
   1. සුළං　　2. වළාකුළු
   3. වර්ෂාපතනය　　4. උෂ්ණත්වය

5) ශ්‍රී ලංකාව අයත්වන්නේ මින් කුමන මහාද්වීපයටද?
   1. යුරෝපා　　2. ආසියා
   2. ඕස්ට්‍රේලියා　　4. අප්‍රිකා

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති වාක්‍ය හරිනම් (✓) ලකුණද, වැරදි නම් (x) ලකුණද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

6) ශ්‍රී ලංකාවත් ඉන්දියාවත් වෙන්වන්නේ පෝක් සමුද්‍ර සන්ධියෙනි. (............)

7) අප ලබාගන්නා සියලුම බලශක්තිවල මූලික ප්‍රභවය වන්නේ සූර්යයා ය. (............)

8) පිළිමතලාව වෙස්මුහුණු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. (............)

9) ජීවන තත්වය උසස්වීම බලශක්ති ඉල්ලුම ඉහළ යාමට හේතු වේ. (............)

10) උතුරු දිශාව හා නැගෙනහිර දිශාව අතර ගිණිකොණ දිශාව පිහිටා ඇත. (............)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන තුළින් තෝරාගෙන හිස්තැන් පුරවන්න.**

(උළු, ජලය, මාලිමා යන්ත්‍රය, වාතය, ජීව වායුව, වලාකුළුවල)

11) උතුරු දිශාව සොයා ගැනීමට ................................ භාවිත කරයි.

12) නිරීක්ෂණය කිරීම මගින් ................................ ස්වභාවය දැනගත හැකිය.

13) මැටි අමුද්‍රව්‍ය ලෙස භාවිත කර ................................ නිෂ්පාදනය කරයි.

14) අම්ල වැසි ඇතිවීමෙන් ................................ දූෂණය වේ.

15) අපද්‍රව්‍යය ප්‍රයෝජනයට ගෙන ................................ උත්පාදනය කළ හැකිය.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් "අ" සහ "ආ" තීරු නිවැරදිව ගලපා යා කරන්න.**

| "අ" තීරුව | | "ආ" තීරුව |
|---|---|---|
| 16) ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිපාලන නගරය | - | වී වගාව |
| 17) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | - | හම්බන්තොට |
| 18) ගංගා නිම්න ප්‍රදේශ | - | දුම්බර |
| 19) මෑතකදී ඉදිකරන ලද ජාත්‍යන්තර වරාය | - | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ |
| 20) පැදුරු විවීමේ කර්මාන්තය | - | බෞද්ධාලෝක මාවත |

(ලකුණු 2×20=40)

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්නවලින් හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.


---

01.(ආ) i. ඔබේ පාසලේ නම ලියා දක්වන්න.

ii. ඔබේ පාසල අයත්වන අධ්‍යාපන කලාපය නම් කරන්න.

iii. පාසල පිහිටි ගම හෝ නගරය නම් කරන්න.

iv. ඔබේ පාසල අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නම් කරන්න. (ලකුණු 2X4=8)




(ආ) ඉහත රූපය නිරීක්ෂණය කරන්න. පාසලේ සිට බලන විට විවිධ ස්ථාන දිශා ගතවී ඇති ආකාරය හඳුනාගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A - ගේට්ටුව පිහිටි දිශාව නම් කරන්න.

B - පිට්ටනිය පිහිටි දිශාව නම් කරන්න.

C - පුස්තකාලය පිහිටි දිශාව නම් කරන්න.

D - වයඹ දිශාවෙන් පිහිටා ඇත්තේ කුමක්ද? (ලකුණු 2X4=08)

02. i. ඔබේ පාසල අයත්වන දිස්ත්‍රික්කය හා පළාත නම් කරන්න. (ලකුණු 02)

ii. ඔබේ පාසල අවට පිහිටි පොදු ස්ථාන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. දිශාව සොයා ගැනීමට උපකරණයක් නොමැති අවස්ථාවක ඔබ විසින් දිශාවන් සොයා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

03. i. උෂ්ණත්වය මැනීම සඳහා භාවිත වන මිනුම් ඒකක දෙක සඳහන් කරන්න. (ලකුණු 02)

ii. පහත සඳහන් උපකරණ භාවිත කර මනිනු ලබන කාලගුණික අංග මොනවාදැයි A B C D අනුපිළිවෙළින් ලියන්න.

A - අනිලමානය　　　C - වර්ෂාමානය

B - උෂ්ණත්වමානය　　　D - සුළං දිශා දර්ශකය (ලකුණු 04)

iii. කාලගුණික තොරතුරු දැනගැනීමෙන් ඇති ප්‍රයෝජන කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04. i. ඔබේ නිවස අවට භූමිය තුළ සිටුවිය හැකි ඖෂධීය ශාක වර්ග දෙකක නම් ලියන්න. (ලකුණු 02)

ii. **පහත සඳහන් සිද්ධිවලට වඩාත් සුදුසු සතුන් වරහන තුළින් තෝරාගෙන A B C D අනුපිළිවෙළින් ලියන්න.**

(ලේනා, මීයා, බස්සා, මී මැස්සා, පොළඟා, බත්කූරා)

A - ඵල හට ගැනීමට අවශ්‍ය පරාගණයට උදව් වේ.

B - විෂ සහිත වන අතර මිනිසාට හානි ගෙන දෙයි.

C - මහාමාරිය වැනි ලෙඩ රෝග බෝ කරයි.

D - රාත්‍රියේදී හැසිරීමට ප්‍රිය කරයි. (ලකුණු 04)

iii. ශාකවලින් අපට ලැබෙන ප්‍රයෝජන තුනක්ද, ශාක විනාශකිරීමෙන් අත් විඳීමට සිදුවන අහිතකර ප්‍රතිවිපාක දෙකක්ද ලියා දක්වන්න. (ලකුණු 05)

05. i. ඔබ ප්‍රදේශයේ ප්‍රජාවගේ දියුණුව උදෙසා පිහිටුවාගෙන ඇති සමිති සමාගම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. පහත සඳහන් උත්සව හා බැඳුන ආගම් මොනවාදැයි A B C D අනුපිළිවෙළින් ලියන්න.

A - තෛපොංගල්

B - වෙසක්

C - හජ්ජි

D - නත්තල් (ලකුණු 04)

iii. (a) ඔබ ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන කර්මාන්ත තුනක් නම් කරන්න.

(b) එම කර්මාන්ත නිසා ඇති වී තිබෙන වාසි දෙකක් ලියන්න. (ලකුණු 3+2=05)

06. i. මිනිසා විසින් භූමිය අවිධිමත් ලෙස පරිහරණය කිරීම නිසා ඇති වී තිබෙන අහිතකර ප්‍රතිඵල දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. භූමිය අවිධිමත් ලෙස පරිහරණය කරන අවස්ථා හතරක් ලියන්න. (ලකුණු 04)

iii. නිවස අවට භූමිය විධිමත්ව පරිහරණය කිරීමට හා ආරක්ෂා කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

07. i. ජලය හිඟවීමෙන් ඇතිවිය හැකි ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ජලය තිරසාරව පවත්වා ගැනීම සඳහා ගතහැකි පියවර හතරක් ලියන්න. (ලකුණු 04)

iii. නිවසේ භාවිත කරන විවිධ බලශක්තීන් අරපිරිමැස්මෙන් පරිහරණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පහක් ලියන්න. (ලකුණු 05)